බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

10 ශ්‍රේණිය
தரம் 10
Grade 10

කතෝලික ධර්මය I පත්‍රය
கத்தோலிக்க சமயம் வினாத்தாள்-I
Catholicism Paper I

පැය එකයි
ஒரு மணித்தியாலம்
One Hour

## I කොටස

(01) මුල් සභාවේ ආරම්භය සිදුවූයේ,

1) නත්තල් දිනයේදීය 2) ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ගාරෝහණයේදී
3) උත්ථාන දිනයේදීය 4) පෙන්තකොස්ත දිනයේදීය.

(02) ආරම්භක ප්‍රසාද නිධානයක් ලෙස සලකුණු නොලබන්නේ,

1) ප්‍රසාද ස්නාපනය 2) අභිවෘද්ධි ආලෝපය
3) පූජකවරයා 4) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

(03) ඊශ්‍රායෙල් පූජා අතර ප්‍රධාන් කොටසක් වනුයේ,

1) පාප පූජා 2) දවන පූජා 3) සාම පූජා 4) වන්දි ගෙවීමේ පූජා

(04) පස්වන පණතට විරුද්ධ ක්‍රියාවක් නොවනුයේ,

1) ගබ්සා කිරීම 2) සියදිවි නසා ගැනීම
3) පරිසරය දූෂණය හා විනාශ කිරීම 4) ධනය, බලය පසු පස හඹා යාම

(05) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ණ සලකුණක් වන්නේ,

1) දේව ප්‍රසාද නිධානයක් 2) පරිශ්‍රමණයක්
3) පූප කැඩීම 4) මන්නා භෝජනය

(06) ග්‍රන්ථකරණය, නාට්‍ය කලාව, සංගීතය තුළ විශාල සේවයක් කළ පියතුමෙකු වන්නේ,

1) ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා 2) ජුසේවාස් පියතුමා
3) ගරු මයිකල් රුදිගු පියතුමා 4) මැක්ෂිමිලියම් කෝල්බෙ මුනිතුමා

(07) "වඩිනු දෙව් මැසියා" ගීතිකාව ගායනා කරනු ලබන කාලය වන්නේ,

1) පාස්කු කාලයේ දී 2) ආගමන කාලයේදී 3) නත්තල් කාලයේදී 4) සාමාන්‍ය කාලයේදී

(08) ක්‍රිස්තු උත්ථානයෙන් දින 50 කට පසු සමරන මංගල්‍ය වන්නේ,

1) පෙන්තකොස්ත මංගල්‍යය 2) ස්වර්ගාරෝහණ මංගල්‍ය
3) ස්වර්ගාරෝපණ මංගල්‍යය 4) පාස්කු මංගල්‍යය

(09) 'කාල් වයටොල්ලා' යන උපත් නාමය හිමිවන ශුද්ධෝත්තම පියතුමා වන්නේ,

1) ශු. දෙවන ජුවාම් පාවුළු මුනිතුමා 2) පළමුවන ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා
3) 16 වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා 4) ශු 23 වන පාමුළු මුනිතුමා

(10) ශු. බයිබලයේ පුරාණ ගිවිසුමට අයත් ඉතිහාස පොත්වල අඩංගු වන්නේ කුමන පොත ද?

1) සිරාක් 2) මලාකි 3) නෙහෙමියා 4) දානියෙල්

(11) මුල් කිතුණු සභාවේ සුවිශේෂ ලක්ෂණය වන්නේ,

1) සියල්ල පොදුවේ තබා ගැනීම 2) යාච්ඤාව

3) දේශනා කිරීම 4) ඒකත්වය

(12) ජේසුස් වහන්සේ විසින් පේදුරුතුමාට ලබාදුන් බලය වන්නේ,

1) පව් සමා කිරීම් 2) ප්‍රාතිහාර්යය කිරීම

3) දේශනා කිරීම 4) පව්කරුවන්ට දඬුවම් කිරීම

(13) ශු. සභාව මෙහෙය වන්නේ කවුද?

1) පාප් වහන්සේ 2) ජේසුස් වහන්සේ 3) දෙවියන් වහන්සේ 4) ශුද්ධාත්මයාණන්

(14) පාවුළු තුමාගේ සංදේශවල ආරූඪ කතෘත්වයන් ලියවූ සංදේශ වන්නේ,

1) 1 කොරින්ති, පිලමොන් 2) 1 තෙසලෝනික තීතස්

3) එපීස, පිලිප්පි 4) 2 තෙසලෝනික, 2 තිමති

(15) එළිදරව් සාහිත්‍යයේ යෙදෙන 10 සහ 12 යන සංඛ්‍යා සංකේතවල නිවැරදි අදහස් වනුයේ

1) විශ්මය, පරිපූර්ණත්වය 2) පරිපූර්ණත්වය, දේව ජනතාව

3) දේව ජනතාව, විශ්වය 4) පූර්ණත්වය, ඊශ්‍රායලය

(16) ශු. පාවුළු තුමාගේ පළමු ධර්මදූත චාරිකාවේ දේශනා කළ නගර වනුයේ,

1) තාර්යස්, දර්බය, සිලුකිය 2) ඉකෝනිය, තාර්සස්, එපීසය

3) සලමිසය, පාපස්, පර්ගා 4) ලුස්කාව, නෝවසය, ග්‍රීසිය

(17) "ටෝරා" යන වචනය භාවිතා වන භාෂාව වන්නේ,

1) ග්‍රීක භාෂාව 2) ලතින් භාෂාව 3) හෙබ්‍රව් භාෂාව 4) ඇරමයින් භාෂාව

(18) ශුද්ධ වූ ජුසේවාස් මුනිඳුන් උපත් ග්‍රාමය වනුයේ,

1) නොවාමුර්ටි 2) සෙන්කොඅලේ 3) ලූසියානා 4) කල්කටා

(19) ලුක්තුමා පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

1) වෛද්‍යවරයෙකි 2) විද්‍යාඥයෙකි 3) ගුරුවරයෙකි 4) ශාස්ත්‍රවේදියකි.

(20) හත හා දහය පණත්වලට විරුද්ධ ක්‍රියා වනුයේ,

1) පොදු දේපළ විනාශ කිරීම, හොර ඡන්ද දැමීම

2) බොරු නඩුවලට පටලැවීම, බෝවන රෝග පැතිරවීම

3) දික්කසාද වීම, විවාහ පොරොන්දු කඩ කිරීම

4) නිළ රහස් එළි කිරීම, අනුන්ගේ දියුණුවට අකුල් හෙළීම

(ලකුණු 2 × 20 = 40)

(21) 'ගෙත්සෙමනය' පිහිටා ඇති කන්ද වන්නේ,

1) ඔලීව කන්ද 2) සීනයි කන්ද 3) රෝබ් කන්ද 4) කල්වාරි කන්ද

(22) දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණයක් නොවන්නේ,

1) පණතක් 2) ගිවිසුමක් 3) යාගයක් 4) පූජාවක්

(23) උත්තම පූජක යාඥාවේ සඳහන් වන සුවිශේෂය වන්නේ,

1) ශු. මතෙව් සුවිශේෂය 2) ශු. මාක් සුවිශේෂය

3) ශු. ලූක් සුවිශේෂය 4) ශු. ජොහාන් සුවිශේෂය

(24) "වග වලසුන් මැදට .................... යවන්නාක් මෙන් මම ඔබ යවමි". හිස්තැනට සුදුසු වචනය වන්නේ,

1) මුව පැටවුන් 2) එළු පැටවුන් 3) බැටළු පැටවුන් 4) කොටළු පැටවුන්

(25) "පාද දෝවනය" කිරීමේ සිදුවීම් දක්වන සුවිශේෂය වන්නේ,

1) ශු. මාක් තුමාය. 2) ශු. ලූක් තුමාය.

3) ශු. ජොහාන් තුමාය. 4) ශු. මතෙව් තුමාය.

(26) මුල් කාලීනව ශ්‍රී ලංකාවට සපැමිණි ධර්මදූත කණ්ඩායම විසින් සිදුකළ විවිධ දයා සේවයන් තුළදී විශේෂ ස්ථානය හිමි වූයේ,

1) සාත්තු සේවයට 2) අධ්‍යාපනයට

3) වීදි දරුවන් රැකබලා ගැනීමට 4) වෘත්තීය පුහුණුවට

(27) ජුදා පාස්කු භෝජනයේ මූලිකාංගයක් නොවන්නේ,

1) පාද දෝවනය 2) පාස්කු බැටළුවා 3) නුමුහුන් රොටි 4) මිදි යුෂ

(28) "කතෝලිකත්වය" යනුවෙන් අදහස් කරනුයේ,

1) ශුද්ධ වූ සභාවය 2) ශුද්ධ වූ සභාවේ විශ්වීය බවය.

3) ශුද්ධ වූ සභාවේ ධර්මදානය 4) ශුද්ධ වූ වචනය

(29) ශ්‍රී ලංකා ශුද්ධ වූ සභා ඉතිහාසය බෙදා දැක්විය හැකි ප්‍රධාන යුග ගණන,

1) 3 කි. 2) 4 කි. 3) 6 කි. 4) 5 කි.

(30) සාන්තුවර ජුසේ වාස් පියතුමා සිදු කළ ප්‍රාතිහාර්යයක් වන්නේ,

1) දැඩි නියඟයකදී වැස්ස ලබා දීම. 2) දඳුරු ඔයෙන් පා ගමනින් එතෙර වීම.

3) තනි අලියකු මෙල්ල කිරීම. 4) ඉහත සියල්ලම

(31) බ්‍රිතාන්‍ය යුගය තුළ මෙරට සේවය සඳහා පැමිණි ධර්මදූත නිකායන් නොවන්නේ,

1) සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකාය, ශු. පවුලේ කන්‍යා සොහොයුරියන්

2) නිර්මල මරිය නිකාය, යහපත් එඬේරා කන්‍යා සොහොයුරියන්ගේ නිකාය

3) ජේසු නිකාය, ෆැන්සිස්කානු කන්‍යා සොහොයුරියන්ගේ පැවිදි නිකාය

4) අපෝස්තලික කාර්මෙල් නිකාය, සදා සරණ කන්‍යා සොයුරියන්ගේ පැවිදි නිකාය

(32) දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු,

1) දෙවියන් වහන්සේට නමස්කාර කිරීම.

2) පාපයන්ට වන්දි ගෙවීම.

3) ආත්මික හා ශාරීරික අවශ්‍යතා ඉල්ලා ගැනීම.

4) මේ කී සියල්ලම

(33) 'ජීවමාන සාන්තුවරිය' ලෙස හඳුන්වන්නේ,

1) ජේසුගේ කුඩා මල තෙරේසා තුමිය  2) ශු. මරිය ගොරෙත්ති තුමිය

3) ලීමාහි රෝස් තුමිය  4) භාග්‍යවන්ත තෙරේසා මව් තුමිය

(34) පෘතුගීසින් මුහුදු බඩ ප්‍රදේශ පාලනය කළ අවධිය වන්නේ,

1) ක්‍රි.ව. 1505 - 1658  2) ක්‍රි.ව. 1505 ට පෙර

3) ක්‍රි.ව. 1658 - 1796  4) ක්‍රි.ව. 1796 - 1948

(35) හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද ගණන කීයද?

1) 2 කි.  2) 3 කි.  3) 4 කි.  4) 6 කි.

(36) යහපත් හා අයහපත් බලවේග අතර ගැටුම පෙන්නුම් කරන්නේ,

1) ද්විත්වවාදය  2) යුගාන්තවාදය  3) සංකේත භාවිතය  4) ආරූඪ නාමය

(37) ශු. පාවුළු තුමා විසින්ම ලියන ලද සංදේශ ගණන වන්නේ,

1) 3 කි.  2) 5 කි.  3) 7 කි.  4) 9 කි.

(38) ජනවන්දනා වර්ෂය තුළ සුදු හා කොළ වර්ණයක් භාවිතා කරන කාලය වන්නේ,

1) ආගමන සමය හා නත්තල් සමය  2) චතාරික සමය හා උත්ථාන සමය

3) නත්තල් සමය හා සාමාන්‍ය සමය  4) සාමාන්‍ය සමය හා චතාරික සමය

(39) "මා හැර අන් කිසිම දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතුය" මෙය සඳහන් වන්නේ කුමන පොතෙහිද?

1) නික්මයාම  2) උත්පත්ති  3) ලෙවී  4) ගණන් කතාව

(40) "පාස්කු අභිරහස" යනු කුමක්ද?

1) ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානය

2) ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය

3) ක්‍රිස්තුස් වහන්සේගේ මරණය

4) ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු ලියන්න.

(ලකුණු 20)
(ල 10 x 4)

(01) 1) දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් 02 ක් සඳහන් කරන්න.
2) ඉශ්‍රායෙලයේ පැවති පූජා බෙදෙන කොටස් 02 නම් කරන්න.
3) ශුද්ධවූ සභාවේ පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා හා අපෝස්තුවරුන් 12 දෙනා අතරින් පළමු ප්‍ර... පරිත්‍යාගිවරයා නම් කරන්න.
4) එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ 02 ක් සඳහන් කරන්න.
5) ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ 02 ක් සඳහන් කරන්න.
6) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට සූදානම් විය යුතු ආකාර 02 සඳහන් කරන්න.
7) ඉශ්‍රායෙල් ජනයා මිසරයේ වහලුන්ව සිටියදී කළ වහල් සේවාවන් 02 ක් ලියන්න.
8) කොළඹ අග්‍රදරගුරු පදවියේ සහයක රදගුරුතුමන්ලා දෙදෙනෙකුගේ නම් සඳහන් කරන්න.
9) පෘතුගීසීන් මෙරට මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ අවධියේ මෙරටට පැමිණි ධර්මදූත කණ්ඩායම් 02 ක් සඳහන් කරන්න.
10) ප්‍රේමයේ පනත ලියා දක්වන්න.

(ලකුණු 2 x 10 = 20)

(02) 1) 'බිය නොවන්න ඔබ මිනිසුන් දිනනු ඇත.'
2) මෙම ආරාධනය ලබා ක්‍රිස්තුන් වහන්සේ පසුපස ගිය පළමු ශ්‍රාවකයන් සතර දෙනා නම් කරන්න.
3) ජේසුන් වහන්සේ පේදුරු තුමාට පැවරූ තුන් ප්‍රකාර කාර්යභාරයන් නම් කරන්න.
4) වර්තමාන ශුද්ධෝත්සම පියාණන් පිළිබඳ පේළි 05 ක් පමණ විස්තරයක් ලියන්න.

(03) 1) ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග හතර නම් කරන්න.
2) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු තුනක් සඳහන් කරන්න.
3) ප්‍රේමය හා සේවය අතපසු කරමින් දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සහභාගී වීම නුසුදුසු බව ශු.පාවුළු තුමා පවසා ඇත. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට අප තුළ තිබිය යුතු සූදානම විස්තර කරන්න.

(04) 1) ලන්දේසීන් මුහුදු බඩ ප්‍රදේශ පාලනය කළ අවධියේදී කතෝලික දහම රැක ගැනීමට දායක වූ පියවරුන් දෙදෙනෙකු නම් කරන්න.
2) නිදහසින් පසු කතෝලික සභාව මුහුණ දුන් ගැටළු තුනක් සඳහන් කරන්න.
3) "කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළම නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේදී ඉටු කර ගත නොහැකිය."
මේ අනුව ඔබට කළ හැකි දෑ පැහැදිලි කරන්න.

(05) 1) දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු 02 ක් සඳහන් කරන්න.
2) තෙවන පණතට අනුව කළ යුතු හා නොකළ යුතු දෑ තුන බැගින් ලියන්න.
3) දේව ප්‍රේමයට ප්‍රති ප්‍රේමය දක්වන ආකාර පහක් ලියා දක්වන්න.

(06) 1) පෙන්තකොස්ත දින ශුද්ධාත්ම ආගමනයේදී සිදු වූ විශේෂ සිදුවීම් ලියා දක්වන්න.
2) මුල් කිතුනු සභාවේ ලක්ෂණ හා ශුද්ධවූ සභාවේ ලක්ෂණ වෙන වෙනම වගුගත කරන්න.
3) ශු. සභාවේ ශුද්ධත්වය රැක ගැනීම සඳහා ඔබට කළ හැකි දේවල් 05 ක් විස්තර කරන්න.

(07) 1) කෙටි සටහන් ලියන්න. (මාතෘකා 02 ක් තෝරා ගන්න.)
1. භාග්‍යවන්ත තෙරේසා මව්තුමිය
2. පළමු පනත
3. පූරාණ ගිවිසුමේ පාස්කු භෝජනය
4. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත
5. කල්වාරි යාගය

(ලකුණු 5 x 2 = 10)